# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,717 — 1966 ඔක්තෝබර් 14 වැනි සිකුරාදා — 1966.10.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් — — — | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම — — | 145 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම — — — | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම — — — | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන — | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම — — — | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම — | — | නොතාරිස් ලැයිස්තුව — — — | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම — — | — | විවිධ දැන්වීම — — — — | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම — — | — | | |



[සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ V වැනි කොටසේ 1963 ජනවාරි සිට මාර්තු දක්වා පළ කරන ලද පුස්තක නාමාවලියක් ද අඩංගු වේ].

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### නුවරඑළියේ දිස්ත්‍රික් නඩුශාලාවේදීය

නුවරඑළියේ පරණ කඩවීදියේ පදිංචි දික්කුඹුරගේ ඒදිරික් සිල්වා ............................................ පැමිණිලිකාරයා.

අංක: ඇම්. 5248 එදිරිව

උඩපුස්සැල්ලාවේ සැන්ට් මාග්‍රට්ස් කඩවීදියේ පදිංචි පියදාස වීරසූරිය ............................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් දේපළෙහි ඉහතකී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිති වාසිකම් සහ ප්‍රයෝජනයන්, රු. 1,649 ක් සහ 63.2.19 දින සිට 63.7.5 දින දක්වා රු. 1,000 ට සියයට 18 බැගින් පොලිය සහ මුලු මුදලට ගෙවා නිමවනතෙක් නීතිපොලිය (මෙසින් ගෙවා ඇති රු. 450 ක් අඩුකර) ඉතුරු මුදල සහ පිස්කල් ගාස්තු හා අනිකුත් සියලුම වියදම් අයකරගැනීමට, 1966 ක්වූ නොවැම්බර් මස 14 දින පෙරවරු 11 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

ශ්‍රී ලංකා දීපයේ මධ්‍යම දිසාවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ උඩපලාත කෝරලේ සැන්ට් මාග්‍රට්ස් නැමැති ගමේ පිහිටි ජී. ඊ. සූ. රත්නායක බදුල්ලේ මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද වර්ෂ 1955 ක්වූ පෙබරවාරි මස 7 වෙනි දින දාතමින් හා අංක 806 දරණ පැලැනේ පෙනෙන උතුරට: අංක 24 දරණ කැබැල්ලද; නැගෙනහිරට: පාරද, ආණ්ඩුව සන්තක ඉඩම සහ අංක් 27 දරණ කැබැල්ලද; දකුණට: අංක 26 දරණ කැබැල්ලද (කොටසක්); බස්නාහිරට: අංක 24 සහ 28 දරණ කැබැලිද මායිම් වන්නාවූ පර්චස් විසිහයක් හා දශම අටයි දෙකක් අ. 0, රූ. 0, ප. 26.82 ක බිම් ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන්කරන ලද බිම් කැබැල්ලෙන් සහ එහි තුල තිබෙන ගොඩනැගිලි සහ සෑම දෙසිනුත් නොබෙදූ තුනෙන් එක (1/3) පංගුවක් වෙත්. තවද ඉහතකී බෙදා වෙන්කරන ලද කැබැල්ල වර්ෂ 1949 ක්වූ අගෝස්තු මස 19 වෙනි දින දාතමින් එච්. සී. සිමිත් බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 209 ඒ. දරණ පැලැනේ පෙනෙන අංක 26 දරණ කැබැල්ලෙන් බෙදා වෙන්කරන ලද කැබැල්ල වෙත්.

ඒ. එම්. එම්. ෂෞකත්,
නුවරඑළියේ අතිරේක නියෝජ්‍ය පිස්කල්.

1966 ක්වූ සැප්තැම්බර් මස 26 දින,
නුවරඑළියේ නියෝජ්‍ය පිස්කල් කායභාලයේදීය.

10-383

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1966 ජූලි මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## කුරුණෑගල දිස්ත්‍රික් නඩුශාලාවේදීය

තිරගන්දහය කෝරලේ කුඹල්පොල පදිංචි කඩවත් පේඩිගේ සියසේන සහ තව කෙනෙක් ......................පැමිණිලිකාරයෝ.

නොම්මරය : 1430/ඇම්බී. එදිරිව

තිරගන්දහය කෝරලේ බමුණාවල පදිංචි ආනා අබ්දුල් හමීඩ් ................................................ විත්තිකාරයා.

මෙහි පහත විස්තර කෙරෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් වර්ෂ 1966 ක්වූ නොවැම්බර් මස 24 දින අපරභාග 3.00 ට පිළිවෙලින් 1 වෙනි ඉඩමේ සිට ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

විත්තිකරු විසින් 1956 ක්වූ ඔක්තෝබර් මස 26 වෙනි දින කේ. වී. වැත්තැව ප්‍රසිඬ නොතාරිස් තැන සහතික කළ අංක 451 දරණ උගස් ඔප්පුව පිට පැමිණිලිකරුවන් වෙත උගස්කරන ලද උගසට නඩු පවරා 1964 ක්වූ දෙසැම්බර් මස 1 වෙනි දින ලබාගත් නඩු තීන්දුව පිට 1965 ක්වූ අගෝස්තු මස 13 වෙනි දින කුරුණෑගල දිස්ත්‍රික් උසාවියෙන් නිකුත් කළ විකිණීමේ ආඥාව පිට රු. 2,000ක් ද, 1964 අප්‍රේල් මස 7 වෙනි දින සිට ගෙවා නිදහස්වන තුරු නීති පොලියද, නඩු ගාස්තුව රු. 361.95ක් ද, පිස්කල් ගාස්තු ආදියෙන් රු. 1,200 ක් අඩුව ඉතිරි මුදල අයකිරීමටය.

1. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරලේ බමුණාවල පිහිටි අක්. 3, රූ. 0, පර්. 08ක් විශාල මීගහමුලවත්ත නමැති ඉඩමට මායිම් :—උතුරට : මීගමුවට යන මහපාරද ; නැගෙනහිරට : මොහම්මදු කනිට අයිති කොටසද, ජයතිලක නීතිඥ තැනට අයිති කුඹුර සහ පිල්ලෑද ; දකුණට : ජයතිලක නීතිඥ තැනට අයිති කුඹුර සහ රංහාමිගේ ඉඩමද ; බස්නාහිරට : මල්ලා හේනයාගේ සහ පහලගෙදර අප්පුහාමිගේ ඉඩමද යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩමෙන් හා ඊට අයිති සෑම දෙයිනුත් නොබෙදූ දෙකෙන් පංගුවක්ය. ලියාපදිංචි කළ අංකය ඒ. 651/225.

2. ඉහතකී බමුණාවල පිහිටි කුරක්කන් සේරුවක් වපසරිය ඇති බමුණාවල වත්ත නමැති ඉඩමට මායිම් :—උතුරට : සෙයියදු මොහම්මදුගේ ඉඩමද ; නැගෙනහිරට : හුලුගල්ලගේ ඉඩමද ; දකුණට : අප්පුහාමි ඔපිසරගේ ඉඩමද ; බස්නාහිරට : තෝබියස්ගේ ඉඩමේ වැටද ; යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩමෙන් හා එහි තුළ සෑම දෙයිදුත් නොබෙදූ දෙකෙන් පංගුවක්ය. ලියාපදිංචි කළ අංකය ඒ. 170.282.

ඒ. බී. රාජනායක,
ව. ප. පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ක්වූ ඔක්තෝබර් මස 4 වෙනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේ දීය.

10-382

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අයවෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකල යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් බාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1966**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | ... | 66. 8.19 | සිකුරාද | ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.8. 26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 ජූලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධියති.



ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රපිතයි